කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13
(නව නිර්දේශය)
2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි
මානවශාස්ත්‍ර පීඨය

දෘශ්‍ය කලා හා සැළසුම්කරණය - VIAD. E 1015

දෘශ්‍ය කලා හා සැළසුම්කරණය හැඳින්වීම

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි | කාලය : පැය 03 යි

---

1 චිත්‍ර ශිල්පියෙකු විසින් ද්විමාන තලයක පිහිටි සිතුවම් අවකාශයක් ත්‍රිමාණරූපී සිතුවම් අවකාශයක් බවට නිර්මාණය කර ගැනීමෙහි ලා අනුගමනය කළ යුතු උපක්‍රම කවරේද? විමසන්න.

2 දෘශ්‍ය කලාවෙහි භාවිත මූලිකාංග පිළිබඳ අවධානය යොමු කරමින් ඒ අනුසාරයෙන් නිර්මාණය වූ දෘශ්‍ය කලාවන්ගේ පරමාර්ථ කවරේදැයි යන්න සාකච්ඡා කරන්න .

3 ශිල්පියෙකු සිය නිර්මාණකරණයේ දී වයනය ප්‍රකාශනයේ ප්‍රබල අවියක් ලෙස භාවිත කළ අයුරු කලා ඉතිහාසය ඇසුරින් නිදසුන් දෙමින් පහදන්න.

4 කලා කෘතියක් යනු තත්කාලීන සමාජ දේශපාලන ප්‍රකාශනයකැයි යන අදහස ඔබ කැමති චිත්‍ර ශිල්පීන් දෙදෙනෙකුගේ කලා කෘති දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න .

5 පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න

- 1 අවකාශය
- 11 ආකෘතිය
- 111 වර්ණ
- 1v රේඛා
- V හැඩතල

6 කලාකරුවකු හට සිය නිර්මාණකරණයේ දී කලා ඉතිහාසය පිළිබඳ අවබෝධය කෙසේ වැදගත් වන්නේ දැයි නිදසුන් සහිතව විමසන්න.

7 කලා කෘතියකින් ප්‍රේක්ෂකයෙකු ලබන තෘප්තිය කලාත්මක වන්නේ හෝ නොවන්නේ කවර කරුණු පදනම් කරගෙන දැයි පෙන්වා දෙන්න.

8 ඔබ මෑත කාලීන ව නැරඹූ චිත්‍ර හෝ මූර්ති ප්‍රදර්ශනයක් පිළිබඳව ඇගයීමක් කරන්න.